| Class | 371.100296 |
| --- | --- |
| No | P35 |

# පාසල්වල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළව සිදු කෙරෙන අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය සිදුවන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්.

OUSL Library.
Donated by.
Dr. W. M. S.
Wanasinghe

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනපති උපාධියේ අවශ්‍යතා පූර්ණය සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන පර්යේෂණ නිබන්ධනය.

ආර්. ආර්. පිනිදිය
511154458

OPEN UNIVERSITY
74473

අධ්‍යාපන පීඨය
ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන අංශය
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල, නුගේගොඩ

2020

OPEN UNIVERSITY OF SRI LANKA
LIBRARY

# Abstract

The main aim of Qualitative education is to hand over knowledge, skills and human values which are essential to personal and carrier development. It is important in educational administration to ascertain that educational activities are carried out in accordance with the laid down educational goals and objectives. In the school system, one of the mechanisms to be put in place towards achieving the goals of the school is Internal supervision. Hence, Internal supervision, should be seen as a conscious effort directed towards finding ways of improving the outcome of each school. This study, therefore, focused on the purpose to assess the way of conducting the Internal Supervision Process in school Teaching – Learning Process. The study aims at investigating the process of internal supervision in four schools of type 1AB, 1C, 2 and 3 in Weligama educational division of Matara Educational Zone. The Main objectives of the research are (1)To Identify the status of the implementation of internal school supervision practices (2)To Identify the role of supervisors (3)To Identify the Challenges that supervisors and Teachers are facing during the internal supervision process. (4)To provide recommendations to overcome the Challenges of the internal supervision process.

Schools play a major role in the education sector, Supervision is a function in schools that draws together the discrete elements of instructional effectiveness into the whole school action. Also educational supervision is among the educational activities that will lead to growth and development of teachers and eventually to improvement of educational quality of the school. Theoretical and methodological Data of the study were drawn from reviewing literature. The survey research design and the descriptive research approach were selected to carry out this study. The school population of this study includes all the 1AB, 1C, Type 2 & Type 3 schools in the Weligama Educational Division of the Matara Educational Zone. Accordingly, four schools were selected in order to maintain a meaningful representation of the school population. From four (04) types of sample schools a total sample of four school principals, sixteen school supervisors and 40 school teachers were selected through random sampling technique. Data for this research was collected from both primary and secondary sources. Questionnaire, interview schedules, observational schedules and document analysis were used as data gathering instruments. Both qualitative and quantitative techniques have been used for data analysis.

The results of the study suggest that internal supervision strategies were carried out effectively in schools. The finding also revealed that the major challenges for internal supervisors were lack of instructional support skills on supervisor side,

internal supervisors were few in number, attitude of both supervisors and teachers, well as less attention given to school based supervision and it is identified that a proper feed back on the supervision is not carried out. Based on the findings of the study, the following recommendations are made, the internal supervision should be given prominence and it should be a continuous process, Principals should be serious in internal supervision and should appoint senior, subject knowledge and efficient teachers according to the circulars. Education offices need to give due attention for enhance the skills of internal supervisors through pre- and in-service training programs. Workshops and seminars should be organized regularly for teachers on needs of supervision. It is also better to reduce the teaching load of internal supervisors so that they can get time to support teachers in the classroom. Recommendations for the future research are also given in the end.

## සංක්ෂිප්තය

ගුණාත්මක අධ්‍යාපනයේ මූලික අරමුණ වනුයේ පුද්ගල සහ වෘත්තිමය සංවර්ධනය සඳහා අවශ්‍ය දැනුම, කුසලතාවයන් සහ මානව අගයන් පවරා දීමයි. පාසල් අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියවලිය යනු කාර්යක්ෂම සහ ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා වන සමස්ත අරමුණු සහ ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ඉතා වැදගත් කළමනාකරණ කාර්යයකි. මෙම අධ්‍යයනයෙහි සමස්ත අරමුණ වනුයේ පාසල් අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ විමර්ශනය කිරීමයි. මේ සඳහා මාතර අධ්‍යාපන කලාපයේ, වැලිගම අධ්‍යාපන කොට්ඨාසයේ, 1AB, 1C, 2 සහ 3 වර්ගයේ පාසල් හතරක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළව සිදු කෙරෙන අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ විමර්ශනාත්මක ව අධ්‍යයනය කරන ලදි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළව පාසල්වල ක්‍රියාත්මක වන අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය හඳුනා ගැනීම, අධීක්ෂකයන්ගේ කාර්යභාරය හඳුනා ගැනීම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළව සිදු කෙරෙන අධීක්ෂණ ක්‍රියාවලියේදී අධීක්ෂකයන් සහ අධීක්ෂිතයන් මුහුණ දෙන ගැටලු හඳුනා ගැනීම සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළව සිදු කෙරෙන අධීක්ෂණ ක්‍රියාවලියේදී පැන නගින ගැටලු සඳහා විසඳුම් යෝජනා කිරීම මෙම අධ්‍යයනයේ සුවිශේෂී අරමුණු වේ.

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබන විධිමත් සංවිධානයක් වන පාසල මඟින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රගති පාලන ක්‍රමය වන අධීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳව අධ්‍යයනයේ සුවිශේෂී අරමුණු වලට අදාළව න්‍යායාත්මක සාහිත්‍ය විමර්ශනයක් සහ ආනුභාවික සාහිත්‍ය විමර්ශනයක් ලෙස දේශීය සහ විදේශීය සාහිත්‍ය විමර්ශනය සිදු කර ඇත. පාසල් අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ ව විශ්ලේෂණාත්මකව විමර්ශනය කිරීම යනු වර්තමානයේ පවතින කාර්යයක් වීම හා විස්තරාත්මක තොරතුරු රැස් කිරීම සඳහා යෝග්‍ය බැවින් විස්තරාත්මක පර්යේෂණ පිරිසැලසුම යටතේ සමීක්ෂණ ක්‍රමය මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදි. අධ්‍යයනය සඳහා නියැදිය වශයෙන් 1AB, 1C, 2 වර්ගය සහ 3 වර්ගයට අයත් පාසල්වල විදුහල්පතිවරුන් හතරදෙනෙකු, අධීක්ෂණ මණ්ඩල සාමාජිකයින් දහසයදෙනෙකු සහ ගුරුවරුන් හතළිස්දෙනෙකු ලෙස සමස්ත නියැදිය හැටක් යොදා ගෙන ඇත. මෙම අධ්‍යයනය සඳහා දත්ත රැස්කිරීමේ උපකරණ වශයෙන් ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා ෂෙඩ්‍යුල සහ නිරීක්ෂණ පත්‍රිකා භාවිත කර ඇත. පර්යේෂණයෙන් රැස්කර ගන්නා ප්‍රමාණාත්මක දත්ත සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම පදනම් කොට ගෙන විශ්ලේෂණය කරනු ලැබීය. සංඛ්‍යා විග්‍රහයේදී ප්‍රතිශත ක්‍රමය වැඩි වශයෙන් භාවිත කරනු ලැබූ අතර අදාළ අවස්ථාවන්හිදී ප්‍රස්තාර භාවිත කර ඇත. ගුණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා සන්ධාර විශ්ලේෂණ ක්‍රමය උපයෝගී කරනු ලැබීය. ඉහත විස්තර කළ ක්‍රමෝපායන් ඔස්සේ ලබාගත්

දත්ත ප්‍රධාන තේමා යටතේ වෙන් කර ඉන්පසුව එම තොරතුරු අනුව විස්තර කරනු ලැබීය.

පාසල් වල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළව සිදු කෙරෙන අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය සඳහා විධිමත් සැලසුම් සහගත ව්‍යුහයක් පාසල් බහුතරයක ක්‍රියාත්මක වන බව, ඒ ඒ පාසල් වර්ගය අනුව සහ ශිෂ්‍ය සංඛ්‍යාව අනුව අධීක්ෂණ මණ්ඩලය පත් කර අධීක්ෂණ කාලසටහනක් මඟින් කාලය වෙන් කර විදුහල්පති විසින් අධීක්ෂණ මණ්ඩලය වෙත ලිඛිතව වැඩ පවරා ඇති බව, විදුහල්පතිවරුන් බහුතරයකට අධීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ පුහුණුවක් තිබුණද අධීක්ෂණ කාර්යය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් සඳහා විධිමත් පුහුණුවක් නොමැති බව, අධීක්ෂණ ක්‍රියාවලියෙන් පසු ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හෝ අධීක්ෂණ පත්‍රිකා ගොනු තුළ ඇති අධීක්ෂිතයන් පිළිබඳ තොරතුරු ගුරු කාර්යසාධනය සඳහා පාසල් බහුතරයක භාවිත කිරීම සිදු නොවන බව මෙහි ප්‍රධාන අනාවරණ විය. පාසල් අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය සඳහා මූලිකත්වය දිය යුතු සේම එය බාධාවකින් තොර අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස පවත්වා ගෙන යා යුතු බව, විදුහල්පතිවරුන් විසින් අධීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ චක්‍රලේඛ වලින් දක්වා ඇති පරිදි ජ්‍යෙෂ්ඨ, විෂයය දැනුම සහිත, කාර්යක්ෂම, ගුණාත්මක බවින් යුතු සහ ගුරුභවතුන් තුළ පිළිගැනීමක් ඇති යෝග්‍ය අධීක්ෂණ මණ්ඩල පත් කිරීම සඳහා ක්‍රියා කිරීම, පාසල් මට්ටමේ අධීක්ෂණ මණ්ඩල සාමාජිකයින් සඳහා අධීක්ෂණය හා කළමනාකරණය පිළිබඳ දැනුම යාවත්කාලීන වීම සඳහා නිරන්තරව ගුණාත්මක සහ යෝග්‍ය පුහුණු වීමේ අවස්ථා සම්පාදනය කිරීම, අභ්‍යන්තර අධීක්ෂකයන්ගේ කාලසටහනෙහි ඇති ඉගැන්වීම් කාලච්ඡේද සංඛ්‍යාව අඩු කර අධීක්ෂිතයන්ට සහය වීමට වැඩි අවස්ථාවන් ලබා දීම යෝජනා ලෙස ඉදිරිපත් කර ඇත. පාසල් අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාවයෙහි වර්තමාන තත්ත්වය පිළිබඳව නිශ්චිතව නිර්ණය කිරීම සඳහා අනාගත පර්යේෂණ සිදු කිරීම අවශ්‍යතාවක් බැවින් ඒ සඳහා යෝග්‍ය යෝජනා අනාගත පර්යේෂකයන් සඳහා ඉදිරිපත් කර ඇත.